# ත්‍රිපිටකාගත දේශනා කුසලතා පිළිබඳ අධ්‍යයනයක්

වැවල ධම්මාලෝක හිමි[1]

## හැඳින්වීම

බුදුන් වහන්සේ ධර්මය දේශනා කිරීමේ දී වාග් ව්‍යවහාරයේ සුවිශේෂ ලක්ෂණ භාවිත කළහ. එයින් ශ්‍රාවකයන්ට ධර්මාවබෝධය පහසු වූවා සේම ධර්මයේ චිරස්ථිතිය ද සිදුවිය. ඉගැන්වීම් ක්‍රමයක් ලෙස ධර්ම දේශනා කිරීමේ දී භික්ෂූන්ට වාග් ව්‍යවහාරයේ විශේෂතා භාවිත කිරීමට බෞද්ධ සම්ප්‍රදාය අනුබල දී තිබේ. වාග් සම්ප්‍රදායේ පවත්නා සුවිශේෂත්වය වන්නේ එමගින් දේශකයා හා ශ්‍රාවකයා අතර සිදුවන පෞර්ෂමය සංවර්ධනයක් තුළින් යථාවබෝධය වෙතට ගමන් කිරීමක් සිදු වීමයි. නූතන පාඨක සමාජය මෙන් නොව අතීත ශ්‍රාවක සමාජය මානසික සංවර්ධනයේ ඉහළ මට්ටමකට පත්වීමේ පසුබිම හඳුනා ගත හැක්කේ එකල වාග් ව්‍යවහාරය පිළිබඳ අධ්‍යයන කිරීම කිරීමෙනි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ත්‍රිපිටකාගත වාග් ව්‍යවහාර ක්‍රමවලින් පැහැදිලි වන දේශන කුසලතා පිළිබඳ තුලනාත්මක විමර්ෂණයක් කිරීමයි.

## පර්යේෂණ මූලාශ්‍රයන් හා ක්‍රමවේදය

පාලි ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයේ සූත්‍ර හා තදනුබද්ධ අටුවා පරීක්ෂා කිරීම මගින් එක් රැස් කර ගන්නා ලද තොරතුරු මෙම අධ්‍යයනයේ දී සලකා බලන ලදී. පැරණි බෞද්ධ සාහිත්‍යගත තොරතුරු සමග තුලනාතමකව සලකා බැලීම සඳහා දේශන කුසලතා පිළිබඳ ලියැවී ඇති නූතන සාහිත්‍යයේ ඉදිරිපත් වී ඇති අදහස් වැදගත් විය.

## සොයා ගැනීම

සාර්ථක දේශනයක් පවත්වන්නේ කෙසේ ද යන්න විවිධ අවස්ථාවල සාකච්ඡාවට බඳුන් වී ඇති ගැටලුවකි. බුද්ධ දේශනාව පරපුරින් පරපුරට ආරක්ෂා කිරීම සඳහා භාවිත කළ පැරණිතම සම්ප්‍රදාය කටපාඩම් කිරීමයි. ත්‍රිපිටකය කටපාඩමින් ආරක්ෂා කිරීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇත (Nyanatiloka Thera, 1957, p.xii). ඒ ඇසුරින් ත්‍රිපිටකයේ දේශනා කුසලතා පිළිබඳ විග්‍රයන් මනාව ඉස්මතු වේ. යහපත් ධර්ම දේශකයෙකු ලෙස ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ

---

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා හා තුළනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

කරුණු රාශියක් මෙහි දී හඳුනා ගත හැකः දේශකයාගේ බාහිර ස්වරූපය, ධර්මය මෙන් ම විෂය බාහිර දැනුම ඇති බව, භාෂාව හා ස්වර හැසිරවීමේ වාග් කුසලතා, දේශනා ඉදිරිපත් කිරීමේ දී සංවිධානාත්මක බව සහ දේශකයාගේ මානසික සංවර්ධනය ආදීය මේ අතර කැපී පෙනේ.

**සාකච්ඡාව**

දේශනා පැවැත්වීම පිළිබඳ විශේෂ දැනුමක් පැරණි භාණකවරුන් හා ධර්ම දේශකයන් කෙරෙහි පැවැතිණි. ඇවතුම් පැවතුම්, ඉරියව්, මුහුණේ ප්‍රකාශනය, ඇඳුම් පැළඳුම් ආදියෙන් ධර්ම දේශකයාගේ බාහිර ප්‍රසන්නතාව වැදගත් කොට සළකන ලදී. ඒ අනුව භික්ෂුව තුන් සිවුර මැවින් පෙරව, විජිනිපත ගෙන, අසුනක වැඩ සිට කය, හිස, අත, පා සැලීම් නොමැතිව බුද්ධ ලීලාවෙන් දහම් දෙසිය යුතුය.

දේශක භික්ෂුව ඇසූපිරූ දැනුමක් ඇත්තෙකු විය යුතුය. ධර්ම කරුණු පමණක් නොව කාලය හා ශ්‍රවක පිරිස පිළිබඳව දැනුම වැදගත් ය. භාෂාවේ ප්‍රයෝග හා දෘෂ්ටි ජාල පිළිබඳ දැනුම සුවිශේෂය. දේශකයා භාෂාවේ හා තර්කයේ සීමා තුළ නො සිට ධර්මය දේශනා කළ යතුය. එයින් ලෝකයේ සෙසු දැනුම සමඟ විවාදයක් නොමැතිව තමන්ගේ දේශනාව ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ.

දේශනාව පැවැත්වීමේ දී ප්‍රජාතන්ත්‍රවාදීව භාෂාව භාවිතය කළ යුතු වේ. භික්ෂුවට පොදු ජන ව්‍යවහාර භාෂාවකින් ධර්මය දේශනා කළ හැකිය. එසේම ශබ්ද උච්ඡාරණ පිළිබඳ කුසලතා උසස් ලෙස භාවිත කොට දේශනා පැවැත්වීම අගය කෙරේ. දහම තේරුම් ගැනීමට යෝග්‍ය වූ පැතිරුණාවූ කනට සුව එලවන්නාවූ නාගරික වචනයෙන් පරිමණ්ඩලාකාර ලක්‍ෂණයෙන් යුක්තව භාෂාවේ ශබ්ද උසස් ලෙස භාවිත කළ හැක. එහෙත් ස්වරයේ ඇලෙන ගීත ස්වරයෙන් ධර්මය දේශනා නො කළ යුතුය (නාලක හිමි, 1994, පි.94). ඉතා මඳ නො වූ ද ඉතා ඉක්මන් නො වූ ද ස්වරයෙන් උපමා, හේතු, උදාහරණ විස්තර කොට දහම් දෙසිය යුතු බව පෙන්වා ඇත. මිහිරි හඬ ඇත්තේ වුවත් භික්ෂුව තමන්ගේ ප්‍රාදේශීය ව්‍යවහාරයන් නිසා බුද්ධ වචනය දූෂිත නොකළ යුතු ය (චුල්ලවග්ග 2, පි.100).

භාෂාව භාවිතයේ දී ධර්මයේ විකෘති ඇති විය හැක (කරුණාරත්න, 1987, පි.16). එහි දී ධර්මයේ නිවැරදිතාව තහවුරු කර ගන්නා ආකාර සතරක් පාසාදික සූත්‍රයේ සඳහන් වේ. ධර්මයේ අර්ථ හා ව්‍යංජන ලක්‍ෂණ නිවැරදි ලෙස ප්‍රකාශ කළ හැකි වන්නේ එම දේශනාවන් බහුල වශයෙන් ප්‍රගුණ කිරීමෙනි. ඒ සඳහා ධර්මය නිවැරදිව හා නිරතුරුව සජ්ඣායනා කළ යුතු විය. ධර්මය පරිවහණය (පරියාපුනන්ති), දේශනා කිරීම (දෙසෙන්ති), වාචෝද්ගත කිරීම (වාචෙන්ති), සජ්ඣායන කිරීම

(සජ්ඣායන්ති), සිතින් විතර්ක කිරීම (විතක්කෙන්ති), විචාරීම (විචාරෙන්ති), මනසින් ප්‍රත්‍යවේක්ෂා කිරීම ( මනසානුපෙච්චන්ති) යන කාරණා ධර්මයේ චිරස්ථිතියට හේතු වන බව දක්වා ඇත (අංගුත්තර නිකාය2, පි.288-290). වාග් ව්‍යවහාරයේ තිබිය යුතු ඉතා උසස් සන්නිවේදන ලක්ෂණ ගණනාවක් බ්‍රහ්ම ස්වරය හා දශවිධ ව්‍යංජන ලක්ෂණ පිළිබඳ විස්තරයේ දැක්වේ.

බොහෝ කරුණුවලින් ශ්‍රාවකයාගේ මනස සංකීර්ණ භාවයට පත් කිරීම දේශනාවේ අරමුණ නොවේ. එබැවින් දේශනාවේ හෝ සාකච්ඡාවේ සංවිධානාත්මක බවක් තිබිය යුතුය. එය ශ්‍රාවකයාගේ ධර්මාවබෝධයට පහසුවකි. ශ්‍රාවකයාගේ ස්වභාවය, ඔහුගේ හැඟීම්, ඔහු විසින් තබන ලද ප්‍රශ්න පදනම් කර ගත් ඉදිරිපත් කිරීම වඩා සුදුසුය. දේශන සම්ප්‍රදාය තුළ ආධ්‍යාත්මික අරමුණු ඉටු කර ගත හැකි වීමට එව දේශනාවල පැවැති සංවිධානාත්මක හා පැහැදිලි බව හේතු විය. අනුපූර්ව ප්‍රතිපදාව අනුගමනය කිරීම හා පර්යාව මුල් කොට ඇති සූත්‍රය මත පිහිටා දහම් දෙසීමෙන් දේශකයාට සංවිධානාත්මක ඉදිරිපත් කිරීමක් කළ හැකි වේ.

බෞද්ධ සූත්‍ර ශ්‍රාවකයාට පහසුවෙන් මතක තබා ගැනීමට හැකි වන අකාරයට ඉදිරිපත් කො ඇත. ඉතා වැදගත් ධර්ම කරුණු ප්‍රකාශ කිරීමේ දී ඒවා පුනරුච්චාරණය වන ආකාරයෙන් පද මාලාවක් යොදා ගෙන ඇත. ධර්ම කරුණු සංඛ්‍යාත්මක පරිගණනය කිරීමේ ක්‍රමය බොහෝ විට යොදා ගන්නා ලදී. බුද්ධ දේශනාවේ අඩු හෝ වැඩි හෝ බවක් නොමැතිව අංග සම්පූර්ණ භාවයක් ඇති විය. බුදුන් වහන්සේ එක් අකුරක් හෝ නිරර්ථක ලෙස නො වදාළහ. සෘද්ධිමය හැකියාවන් හා වෙනත් වාග් ප්‍රයෝග භාවිත කිරීමෙන් ධර්මය පිළිබඳ වැරදි වැටහීම් ඇති විය හැකි ය. එබැවින් සාර්ථක දේශනාවක් තුළින් අවබෝධයට පත් වීම ආශ්චර්යමත් සිද්ධියකි. බුදු දහම ලෞකික ප්‍රතිලාභ, කීර්ති, ප්‍රශංසා අපේක්ෂාවෙන් දේශනා කරන ලද්දක් නො වේ. ධර්ම ගෞරවයෙන් හා කරුණා සිතින් යුතුව ශ්‍රවණය සඳහා සුදානම් පිරිසකට ධර්මය දේශනා කිරීම බෞද්ධ සම්ප්‍රදාය යි. ධර්මාවබෝධ ලත් භික්ෂුව ධර්මය දේශනා කිරීමට සැබෑ සුදුස්සෙකි.

**සමාලෝචනය**

පැරණි ආගමික හා දාර්ශනික සම්ප්‍රදායන්ගේ ප්‍රධාන ඉගැන්වීම් මාධ්‍ය වූයේ දේශනාව හා සාකච්ඡාවයි (Nyanaponika Thera, 1997). බුදු සසුනේ අනුශාසනාව ප්‍රාතිහාර්යකි.(දීඝනිකාය 3, පි.6) ගුරුවරයා හා ශිෂ්‍යයා අතර උසස්

මානසික සම්බන්ධයක් නිර්මාණය වීම අවබෝධය ලැබීමේ මාර්ගයක් විය. දේශනා ක්‍රමය ඔවුන් අතර ඍජු අභිමුඛ වීමක් විය. ප්‍රශ්නය හා විසඳුම යනු තොරතුරු හෝ දැනුම පිළිබඳ කාරණයක් නොව ගුරුවරයා හා ශිෂ්‍යයා අතර බැඳීමක් බව මෙයින් තහවුරු කෙරිණි. මේ නිසා වාග් සම්ප්‍රදාය ඥානය ඇති කරනා ක්‍රමයකි. පළමුව බුදු දහම තුළ මෙම දේශනා සම්ප්‍රදායේ විශේෂතා ඉදිරිපත් වන්නේ එවැනි අධ්‍යාත්මික ශික්‍ෂණයට අනුබල දෙන සන්නිවේදන ක්‍රමයක් ලෙසිනි. දෙවනුව නූතන අධ්‍යාපනවේදීන් අසනු ලබන ආකාරට සාර්ථක දේශනයක් පවත්වන්නේ කෙසේ ද යන්න පැනයට පිළිතුරුක් ලෙසින් මෙම ක්‍රමවේද භාවිතයට ගත හැකි ය. පාඨක සමාජයක මෙන් නොව ශ්‍රාවක සමාජය තුළ ආධ්‍යාත්මික සංවර්ධනය යථාර්යක් බවට පත් කළ හැකි ය. නූතන ගුවන්විදුලිය හා රූපවාහිනිය ශ්‍රාවක සමාජය තාක්‍ෂණික වශයෙන් ඉහළ තලයකට ඔසවා ඇත. එසේ වුවත් පැරණි දේශන සම්ප්‍රදායේ දැනුම හා කුසලතා තාක්‍ෂණය විසින් යටපත් කොට ඇති බව පෙනේ. බෞද්ධ සම්ප්‍රදාය තුළ දේශන කුසලතා මගින් පැහැදිලි කෙරෙන්නේ දේශකයාට ශ්‍රාවකයා ඍජුව අභිමුඛ වන පරිසරයක් තුළ අධ්‍යාත්මිකත්වය පදනම් කර ගත දේශනා ක්‍රමයක අවශ්‍යතාවයි.

**ප්‍රමුඛ පදඃ** දේශන කුසලතා, වාග් සම්ප්‍රදාය, බුදු දහම, ත්‍රිපිටකය,

**ආශ්‍රිත ග්‍රන්ථ**

අංගුත්තර නිකාය 2, (2005). *බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා*. දෙහිවල: බෞ.ස.ම.

කරුණාරත්න, ඩබ්ලිව්. ඇස්. (1992). බෞද්ධ දර්ශනය හා චරණය. කොළඹ: සමයවර්ධන.

චුල්ලවග්ග පාළි 2 (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. දෙහිවල: බෞ.ස.ම.

දීඝ නිකාය 3, (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාල. දෙහිවල: බෞ.ස.ම.

නාලක හිමි, බෙංගමුවේ (1994). පාලි භාෂාව අශෝක ප්‍රාකෘතයට ඇති සමීපතාව, *පාලි ව්‍යාකරණ තරංගණී*. කැලණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය.

Nyanaponika Thera and Hecker, Hellmuth (1997). *Great disciples of the Buddha.* Wisdom Publication. Somerville

Nyanatiloka Thera (1957). *Guide through the Abhidama Pitaka.* 2nd edition by Nyanaponika Thera. Colombo: Bouddha Sahitya Sabhava.